ජනාධිපති කාර්යාලය

ஜனாதிபதி அலுவலகம்

PRESIDENTIAL SECRETARIAT


මගේ අංකය:PS/DSP/DPU/05/03/09

2019 මාර්තු මස 17 දින

ලේකම්
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

<u>**මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය හඳුනා ගැනීම හා ප්‍රතිකාර වැඩසටහන් පුළුල් කිරීම සම්බන්ධ ජාතික සමීක්ෂණය - 2019**</u>

දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මෙහෙයවීමෙන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්ෂණයෙන්, දිවයිනේ සියලුම ග්‍රාම නිලධාරී වසම් (14022) ක් ආවරණය වන පරිදි මත්ද්‍රව්‍ය භාවිතය හා ව්‍යාප්තිය පිළිබඳව සමීක්ෂණයක් ඉතා කඩිනමින් සිදු කරන ලෙස අතිගරු ජනාධිපතිතුමන් විසින් මා වෙත උපදෙස් ලබා දී ඇත.

02. තව ද, අදාළ ප්‍රදේශ භාර නියෝජ්‍ය පොලිස්පතිවරුන්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන් හා ප්‍රජා පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ ද දායකත්වය මේ සඳහා ලබා දෙන ලෙස උපදෙස් ලබා දී ඇත.

03. ඒ අනුව, මෙම කාර්යය සම්බන්ධීකරණය සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නම් කරන එවන ලද නිළධාරීන් සඳහා පුහුණු වැඩමුළු තුනක් 2019/03/19, 23, හා 25 යන දිනවලදී කොළඹ, වවුනියාව හා දඹුල්ල යන ස්ථානවල දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

04. එහෙයින් මෙය අත්‍යාවශ්‍ය කටයුත්තක් සේ සලකා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් අපගේ පුහුණුව ලත් නිළධාරීන් වෙත ලබා දීමට නියමිත පත්‍රිකාවට අනුව ග්‍රාමීය මට්ටමේ සමීක්ෂණ කටයුතු සිදුකර පොලිස් VPN සේවාව හරහා 2019 අප්‍රේල් මස 10 දිනට පෙර අදාළ තොරතුරු වාර්තා අප වෙත එවීමට දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුම්වත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

උදය ආර්.සෙනෙවිරත්න
ජනාධිපති ලේකම්

පිටපත

පොලිස්පති, ශ්‍රී ලංකා පොලීසිය - කරු.අ.ක.ස.


ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01
දුරකථන / தொலைபேசி ++ 94 (0) 11 2354418 / ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் ++ 94 11 2446657
ඊ-මේල් / மின்-அஞ்சல் prsec@presidentsoffice.lk